C
378
ATT

# " ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබන කාන්තාවන් මුහුණ පාන ගැටළු පිළිබඳ අධ්‍යයනයක් "

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ අධ්‍යාපන ශාස්ත්‍රපති
උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනය

ආර්. පී. අත්තනායක

බී. ඒ. (ශ්‍රී ලංකා) ; අධ්‍යාපන ඩිප්ලෝමා

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

1993

පර්යේෂණ උපදේශක

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී

ආචාර්ය එල්. ඒ. කොබ්බෑකඩුව මහත්මිය

453177

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

## අධ්‍යයනයේ සැකැස්ම

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබන කාන්තාවන් මුහුණ පාන ගැටළු පිළිබඳව කරන ලද පර්යේෂණය ඇසුරෙන් සකස් කරන ලද මෙම නිබන්ධනය පරිච්ඡේද හයකින් සමන්විත වේ.

මෙහි පළමුවෙනි පරිච්ඡේදයෙන් මාතෘකාව හැඳින්වීම සහ ඊට අදාළ වන සංකල්පයන් විග්‍රහ කිරීමට බලාපොරොත්තු වේ. කාන්තාවගේ භූමිකාවන් වෙනස් වී ඇය පුළුල් සමාජයට පිවිසීමත් සමඟ ඇය සම්බන්ධයෙන් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ පර්යේෂණ කිරීමේ අව-ශ්‍යතාව මතු විය. අද කාන්තා අධ්‍යාපනය පිළිබඳව විශේෂ උනන්දුවක් දක්වනු දැකිය හැක. මෙවන් අවධියක කාන්තාව පශ්චාත් උපාධි අධ්‍යාපන කාර්යයේ දී මුහුණ පාන ගැටළු පිළිබඳව විමසා බැලීම කාලීන අවශ්‍යතාවක් බව පැහැදිලි කරුණකි. එසේ කාලීන අවශ්‍යතාවක් පදනම් කර ගත් පර්යේෂණ මාතෘකාවක් වශයෙන් මෙය හඳුන්වා දී ඇත.

ඉන් අනතුරුව මෙම මාතෘකාවට අදාළ සංකල්පයන් විග්‍රහ කෙරේ. විශ්ව විද්‍යාලය, පශ්චාත් උපාධි අධ්‍යාපනය, කාන්තාව හා ගැටළු යන සංකල්පයන් විග්‍රහයට ලක් කරනු ලැබේ. අටසිය වසරක පමණ විශ්ව විද්‍යාල ඉතිහාසය තුළින් බිහි වූ නිර්වචනයන් ඇසුරෙන් විශ්ව විද්‍යාලය යන්න කෙබඳු ආයතනයක්දැයි හඳුන්වා දෙන අතර, එහි පරමාර්ථ හා අරමුණු ද සාකච්ඡා කෙරේ. මෙහි දී එය වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කර ගැනීමට දරණ වෑයම පිළිබඳව ද සැලකිලිමත් වේ. තවද, රටින් රටට පශ්චාත් උපාධි අධ්‍යාපනය ලෙස සලකන්නා වූ උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳව හඳුන්වා දෙමින් පශ්චාත් උපාධි අධ්‍යාපන සංකල්පය විග්‍රහයට ලක් කෙරේ. කාන්තාව පිළිබඳ විග්‍රහයේ දී ඇය සම්ප්‍රදායිකව සිටි තත්ත්වයෙන් මිදී වර්තමානයේ සිටින තත්ත්වයට පත් වූ අයුරු සාකච්ඡා කරනු ලබන අතර, එමෙන් කාන්තාව පුරුෂ පක්ෂය හා සම තැන්හි සිටින්නියක ලෙස හඳුන්වා දෙයි. විවිධ ශබ්ද කෝෂයන්හි ගැටළු යන්න අර්ථ දක්වා ඇති අයුරු සැලකිල්ලට ගනිමින් ගැටළු සංකල්පය විග්‍රහ කෙරේ.

දෙවෙනි පරිච්ඡේදය කාන්තාව උසස් අධ්‍යාපනය ලැබීමේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කිරීමට වෙන් කෙරේ. ඉන් අපේක්ෂා කරනු ලබන්නේ එම ක්ෂේත්‍රයේ දී ඔවුන් මුහුණ පාන ගැටළු පිළිබඳව සොයා බැලීමේ වැදගත්කම හුවා දැක්වීමයි. ගැටළු අනාවරණය කර ගෙන පිළියම් යෙදීමේ අවශ්‍යතාව මතු වන්නේ කාන්තාව වැඩිදුර අධ්‍යාපනය ලැබීමේ වටිනාකම පිළිබඳව කෙරෙන තක්සේරුව අනුවය. මෙහි දී ඇය උසස් අධ්‍යාපනය ලැබීම ඇයට පෞද්ගලිකව ද, පොදුවේ පවුලට ද, සමාජයට ද යහපත උදා කිරීමට බලපාන අයුරු සාකච්ඡා කෙරේ. අයිතීන් දිනා ගැනීමට සමත් වූ ඇය ඒ තුළින් මුවහත් කර ගනු ලැබූ ශක්තීන් යොදවා ආර්ථික, දේශපාලන හා සමාජ ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක වන අයුරු තව දුරටත් සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ.

තුන්වෙනි පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාන්තා සහභාගිත්වය පිළිබඳව විමසීමට බලාපොරොත්තු වේ. මෙහි දී ශ්‍රී ලාංකික කාන්තාව අධ්‍යාපනයට පිවිසි ආකාරය ලුහුඩින් දැක්වේ. අධ්‍යාපනයේ කාන්තා සහභාගිත්වය ක්‍රමිකව විකාශනය වූ අයුරු සහ නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙස පුළුල්ව ව්‍යාප්ත වූ අයුරු සාකච්ඡා කෙරේ. මෙහි දී අධ්‍යාපනය හා වෘත්තීය සහභාගිත්වය අතර සම්බන්ධය පිළිබඳව ද සැලකිල්ලක් යොමු කරනු ලැබේ. මෙසේ ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශේෂයෙන්ම, විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ කාන්තා සහභාගිත්වය වැඩි වීම පිළිබඳව සැලකිලිමත් වනුයේ ඒ ක්ෂේත්‍රයේ දී ඔවුන් මුහුණ පාන ගැටළු පිළිබඳව අනාවරණය කර ගැනීමේ අවශ්‍යතාව මතු කර දැක්වීමටය.

පර්යේෂණ ක්‍රම වේදය, ජනගහණය, නියැදිය හා තොරතුරු ලබා ගන්නා ආකාරය හතරවෙනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය මේ පර්යේෂණය සඳහා අදාළ කර ගැනීමට හේතු වූ සාධක ලුහුඩින් දක්වනු ලැබේ. එසේම එම ක්‍රමය යටතේ දත්ත ලබා ගැනීමට උපයෝගි කර ගනු ලබන ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා මෙහිදී ද තොරතුරු ලබා ගැනීමට උපයෝගි කර ගනු ලබන අයුරු විස්තර කිරීමට බලාපොරොත්තු වේ.

පස්වෙනි පරිච්ඡේදය වෙන් කරනු ලබන්නේ ප්‍රතිඵල විග්‍රහ කිරීම සඳහාය. මෙහි දී මුලින්ම අධ්‍යාපන කටයුතුවල නිරතව සිටින කාන්තාවන් වෙත ඉදිරිපත් කළ ප්‍රශ්නාවලිය

විග්‍රහ කෙරේ. අනතුරුව ස්වාමිපුරුෂයන් වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලිය හා සම්මුඛ සාකච්ඡාවල දී ලබා ගත් ප්‍රතිචාර විග්‍රහ කිරීමට බලාපොරොත්තු වේ. මෙහි දී මේ විග්‍රහය ප්‍රතිශත ඇසුරෙන් සිදු කෙරේ. මෙම ත්‍රිවිධ උපක්‍රම මගින් ලබා ගන්නා තොරතුරු අනුසාරයෙන් කාන්තාවන් මුහුණපාන්නා වූ ගැටළු අනාවරණය කොට ඉදිරිපත් කරනු ලබයි.

හයවෙනි පරිච්ඡේදයෙන් පර්යේෂණයේ සමාලෝචනය හා ගැටළුවලට විසඳුම් ලෙස කෙරෙන යෝජනා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

පර්යේෂණයේ අරමුණු:

ප්‍රධාන අරමුණු:

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතුවල යෙදී සිටින කාන්තාවන් මුහුණ පාන ගැටළු අනාවරණය කර ගැනීම හා ඒවා සමාජයීය දෘෂ්ටිකෝණයකින් විමසා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. මෙහි දී කාන්තාවන් මුහුණ දෙන ගැටළු කෙරෙහි 'ස්ත්‍රීත්වය' කිසියම් බලපෑමක් කර තිබේදැයි විමසා බැලීමට අදහස් කෙරේ. පවුල තුළ ඇයට අයත් භූමිකාව ඉටු කිරීමට හෝ ඒ පිළිබඳව සමාජය දරණ අදහස් එම ගැටළු ඇතිවීමට හෝ ඒවා තීව්‍ර වීමට බලපාන්නේදැයි විමසා බැලීමට බලාපොරොත්තු වේ.

සුවිශේෂී අරමුණු:

කාන්තාව උසස් අධ්‍යාපනය ලැබීමේ වැදගත්කම සලකා බැලීම හා එය යුගයේ අවශ්‍යතාවක් බව අවධාරණය කිරීම. කිසියම් පුද්ගලයෙකු පරිපූර්ණත්වයට පත් කරවන්නා වූ ක්‍රියාදාමයක් වන අධ්‍යාපන ක්‍රියාවලියේ ඉහළ මට්ටමකට ළඟාවීමට ඇයට ඇති අයිතිවාසිකම් තුළින් තමාට හා සමාජයට සේවයක් සැලසීමේ වැදගත්කම මතුකර දැක්වීම.

කාන්තාව උසස් අධ්‍යාපනය ලැබීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික සමාජය දරණ ආකල්පයන් පිරික්සීම. මෙහි දී විශේෂයෙන් සලකා බලනු ලබන්නේ උසස් අධ්‍යාපනයේ නියුතු වන කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයන් දරණ අදහස් පිළිබඳවයි. පුරුෂාධිපත්‍යය ක්‍රියාත්මක වේ නම් එය කොතෙක් දුරට කාන්තා අධ්‍යාපනයේ දී ගැටළු සංකීර්ණත්වයට පත් වීම කෙරේ බලපා තිබේදැයි විමසීමට අදහස් කරනු ලැබේ. පවුල හෝ ඉන් බාහිර සමාජය විසින් දරන්නා වූ ආකල්ප පිළිබඳව කාන්තාවන් තුළ ඇති අදහස් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතුවල දී ගැටළු වී තිබේදැයි විමසුමට ලක් කිරීමට බලාපොරොත්තු වේ.

උසස් අධ්‍යාපනය ලැබීමේ දී ශ්‍රී ලාංකික කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවන ගැටළු කෙරෙහි වගකිවයුත්තන්ගේ අවධානය යොමු කිරීම. කාන්තාව උසස් අධ්‍යාපනය ලැබීම මුළු මහත් සමාජයටම බලපෑමක් ඇති කරන්නක් නම් ඒ සඳහා ඇති බාධාවන් ඉවත් කිරීම අත්‍යවශ්‍ය වේ. එක් අතකින් එය ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමක් වේ. අනෙක් අතට ඒ මගින් ඵලදායී සේවාවක් අපේක්ෂා කළ හැකිය.

පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතුවල නියැලීමේ දී කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවන ගැටළු වලට විසඳුම් ලෙස සුදුසුයැයි හැඟෙන යෝජනා ඉදිරිපත් කිරීම.